# බෞද්ධ විශ්ව න්‍යායවේදය පඨනය කිරීමෙහිලා අධියථාර්ථවාදී සාහිත්‍ය න්‍යායෙහි උපයෝගීතාව

සුනිල් වික්‍රමසිංහ[1]

බටහිර සාහිත්‍යය බුද්ධි ඥානය තුළපරිකල්පිත අධියථාර්ථවාදය එයට පූර්වයෙන් පැවතියථාර්ථවාදයට ඍජු පිළිතුරක් වශයෙන් විස්තීර්ණ වූවකි. එහි මූලික පදනම 'විශ්වසනීයත්වය' මත පදනම් වූ සත්‍යාභාසය පූර්වංගම කරගත් දර්ශනයක් වේ. විශ්වසනීයත්වය යනු විශ්වාස කළ හැකි, තථ්‍ය ධර්මතා සමෝධානගත, අභව්‍යමය තත්ත්වවලින්වියුක්ත හැසිරීම් සහිත වූවක් වේ. අධියථාර්ථවාදය ආශ්චර්යාත්මක (මායාමය) තත්ත්ව උපනිශ්‍රය කරගෙන තත් මතවාදයට අභියෝග එල්ල කරයි. එනිසා අධියථාර්ථවාදය තුළදී සාමාන්‍ය ව්‍යවහාරය තුළ සිදු නොවිය හැකි මායාමය හැසිරීම්වලට මූලිකත්වයක් ලබා දේ. එය නවකතාව තුළට ඉන්ද්‍රජාලිකත්වයේ ඡායා නිදන්ගත කරයි.

විශ්වයේ ආරම්භය, පැවැත්ම හා අවසානය පිළිබඳව දර්ශනික කතිකා ගොඩනගන බෞද්ධ විශ්වන්‍යායවේදයෙහි හරයාත්මක ගැඹුරද එදිනෙද අප පිළිග න්නා 'සත්‍ය' ධර්මතා මගින් කියවීම අසීරුය. සාමාන්‍ය ඇසට විද්‍යමාන නොවන අධිභෞතික තත්ත්ව පිළිබඳව එහිදී දර්ශනිකත්වයට ලක් කෙරේ. මෙම අධිභෞතික කාරණා (අපාය, දිව්‍ය ලෝක, ලෝක විනාශය වැනි...)හා අධියථාර්ථවාදී සාහිත්‍ය පඨිත තුළ සමාන්තර කියවීම් රාශියක් විද්‍යමාන වේ. අප මේ පර්යේෂණ පත්‍රිකාව මගින් අරමුණු කරන්නේ එය පිළිබඳව අධ්‍යයනය කිරීමය.

විශේෂයෙන් බුදු දහම හා සාහිත්‍යය අතර අන්තර් ශික්ෂණය වර්ධනය කිරීමේ මෙවලමක් වශයෙන් මෙවැනි අධ්‍යයනයක වැදගත්කම අවබෝධ කර ගත හැකිය. එය ශාස්ත්‍රීය වශයෙන් තත් ද්වි විෂයාන්තර වර්ධනය සඳහා වර්ධනය කළ යුත්තක්ද වේ.''බෞද්ධ විශ්ව න්‍යායවේදය කියවීම සඳහා අධියථාර්ථවාදය යොදා ගත යුත්තේ ඇයි?'' යන පර්යේෂණ ගැටලුව මේ සඳහා උපයුක්ත කරගන්නා ලදි. ''බටහිර සාහිත්‍යය න්‍යාය මගින් බුදු දහම කියවිය නොහැකිය'' යන මතවාදය මූලික පසුබිමක් වශයෙන් ප්‍රස්තුත විෂයට අදළ කර ගැණින. එමෙන්ම බුදු දහමේ ඉගැන්වීම් යනු පසුකාලීන සාහිත්‍යය තුළ වර්ධිත න්‍යායික මෙවලම් ආශ්‍රයෙන් වුවද පඨනය කළ හැකි දර්ශනයක් බවද අප අවබෝධ කර ගත යුතුය.''අධියථාර්ථවාදය අපරදිග සමාජ සන්දර්භය තුළ රෝපණය වූ න්‍යායික කාරණයක් වුවද එය පඨනය සඳහා පෙරදිග දර්ශනයෙහි ඇතැම් කාරණාද උපනිශ්‍රය කරගත හැකිය'' යන උපන්‍යාසය මේ සඳහා භාවිතයට ගැණින. මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කර ගන්නා ලද ක්‍රමවේදය පුස්තකාලය සමීක්ෂණය යටතේ සිදු වූ අතර අධියථාර්ථවාදී සාහිත්‍යය න්‍යායෙහි මූලික සංකල්ප ආශ්‍රයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.

**ප්‍රමුඛ පද** : බෞද්ධ විශ්වන්‍යායවේදය, යථාර්ථවාදය, අධියථාර්ථවාදය, මතවාදය

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
sunilwick2010@gmail.com,